"සොරි සර්.. මං හිතලා කිව්වෙ නැහැ" ස්නේහා ජනේලය වෙතින් මෑත්ව අකලංකගේ ඇඳ නැවත සකස් කරන්නට ගත්තා ය. පොඩිවී තිබූ ඇඳ රෙදි නිසි පිළිවෙලට තබා ඇය ඇඳ සකස් කරන අයුරු අකලංක හැඟීම් විරහිතව බලා සිටියේ ය. හිතේ කෝපය පහව යන තෙක් කතා නොකර සිටින්නට ඔහු උත්සාහ කළේ ය. අවශ්‍ය අනවශ්‍ය හැම දේටම කෝප ගැනීමේ මේ පුරුද්ද වහා සමනය කර ගත යුතු යයි ඔහුගේ හිත කියයි. මේ කෝපය පාලනය කරගන්නට යම් ක්‍රමයක් තිබිය යුතුය. උපදේශන සේවාවට සේවය ලබා ගන්නැයි ඔහුට කීප වතාවක් අවවාද ලැබී තිබුණද කිසිම දිනෙක ඔහු ඒ සඳහා වෙහෙස නොවුණේ ය. එවන් සේවාවකින් තමා වෙනස් කරන්නට හැකි යයි ඔහු කිසි විටෙකවත් නොසිතුවේ ය.

"කෙල්ලගෙ හිත රිදෙන්නැති" ඔහුගේ හිත කියයි. ".. පව්" කවදාවත් නැතිව අනුකම්පාවක්ද එයට එකතුවෙයි. පාලු කපන්නට හෝ මෙතන සිටින්නේ ඇය පමණකි. දැන් අයද කරබාගෙන වැඩක යෙදී සිටියි.

ස්නේහා බොහෝ වේලාවක් ගෙන ඇඳ හැදුවා ය. ඇඳ හදන එක ඇටන්ඩන්ට්ලාගේ වැඩ ය. ඒ වුණාත් කමක් නැත. කලබලයක් නැත. කරන්නට වෙන වැඩකුත් නැත. ඇත්තම ලෙඩෙක් කාමරයේ හිටියා නම් කරන්නට දහසක් වැඩ ය. වරින් වර රුධිර පීඩනය මැනිය යුතු ය. උෂ්ණත්වය මැනිය යුතුය. තවත් බොහෝ දේ ය. වගකීමත් වැඩි ය. ඒත් ස්නේහා ඒ වැඩ වලට කැමතිය. ඒ වැඩ වල නිරතව සිටින විට කාලය යනවා නොදැනෙයි. ඒත් අද කරන්නට සිදුව ඇත්තේ කම්මැලි වැඩකි. ඉක්මනට වැඩ අවසන් කර ගෙදර යන්නට ඇත්නම් එය ඉතා පහසුවකි.

සියල්ලටම වඩා අකලංකගේ තාත්තා කතා කළ ආකාරය ස්නේහාගේ සිත නොගත්තේ ය. ඒ තරම් අධිකාරිවාදී ස්වරයකින් කතා කරන්නට තරම් බලයක් ඔහුට කෙසේ ලැබුනේ ද? තමා ඔහු යටතේ සේවය කරන සේවිකාවක නොවේ. කොහේවත් සිට පැමිණි මිනිසකු තමාගෙ ගෙදර යන්නට එන්නට වාහන සූදානම් කළේ කෙසේද?

> ඇත්තම ලෙඩෙක් කාමරයේ හිටියා නම් කරන්නට දහසක් වැඩ ය. වරින් වර රුධිර පීඩනය මැනිය යුතු ය. උෂ්ණත්වය මැනිය යුතුය. තවත් බොහෝ දේ ය. වගකීමත් වැඩි ය. ඒත් ස්නේහා ඒ වැඩ වලට කැමතිය. ඒ වැඩ වල නිරතව සිටින විට කාලය යනවා නොදැනෙයි. ඒත් අද කරන්නට සිදුව ඇත්තේ කම්මැලි වැඩකි.

අකලංකගේ තාත්තා හා රෝහලේ පාලනාධිකාරිය අතර යම් සම්බන්ධයක් ඇති බව නම් නිසැක ය.

ස්නේහා සවස තේ වේලාවට කාමරයෙන් පිටව යන විටත් අකලංක සිටියේ ජනේලය අසළ සිටගෙන ය. ඇය පිටව යන බව දුටුවත් ඔහු කිසිවක් නෑසුවේ ය. ස්නේහා නැවත එන විටත් ඔහු එතැනම සිටගෙන ඈත බලා සිටිනු පෙනුණි. කාමරයෙන් පිටතට යමින් එමින් ඇය ඉතිරි පැය එකහමාර ගෙවා ගත්තා ය. වැඩ අවසන් කරන වේලාවේදී පමණක් ඈ අකලංක දෙස බැලුවා ය.

"සර් මං ඕෆ් වෙන වෙලාව.. මං දැං යනවා.. ඊට පස්සෙ අවශ්‍ය දෙයක් තියෙනවා නං බසර් එක ගහන්න.. කවුරු හරි එයි" ඈ දොර අසළ සිට කීවා ය.

"ස්නේහා.." ඔහු ඇය කියූ දෙය නෑසුණා සේ ඇය ඇමතුවේය. ස්නේහා දොර අසළ සිට ඔහු දෙ හැරී බැලුවා ය.

"සොරි.." ඔහු කීවේ ය.

"සොරි කියන්න දෙයක් නෑ සර්.. මේක මගේ රස්සාව.. ඕනෙම ලෙඩෙකුට සාත්තු කරන එක මගේ ඩියුටිය.. මං ඒක කරනවා.. එච්චරයි.." ඈ කීවා ය.

"මාත් ලෙඩෙක් කියලද ඔය කියන්නෙ?" ඔහු ඇසුවේ ය.

"මේ ඇඳට දාන හැම කෙනෙක්ම මට ලෙඩෙක් තමයි.. ඩොක්ටර්ස්ල එහෙම තීරණය කරලනෙ මෙතනට එවන්නෙ... මාත් ඉතින් එහෙමයි මං හිතන්නෙ.. " ස්නේහා එපමණක් කියා කාමරයෙන් පිටවන්ට හැරුණාය. නැවත් යමක් සිහිපත් වවා සේ හැරී ඔහු දෙස බැලුවා ය. "රෑට කෑම ගෙනාවම කවන්න කෙනෙක් නෑ කියල නොකා ඉන්න එපා.. යන්නං සර්.. බුදු සරණයි" අන්තිම වචන දෙක කියවුණේ නොසිතාම ය. පුරුද්දට වාගේ ය. එහෙත් ඒ වචන අකලංකගේ සිත මොහොතකට කළඹන්නට සමත් විය.

ස්නේහා පහළට යන විට ඇය එනතුරු රියැදුරු චන්ද්‍රසේන ලොබියට වී බලා සිටියේ ය.

"මිස් එනකල් බලා හිටියෙ" ඔහු කීවේ ය. ".. මොකද මේ අලුත් ඕඩරයක්? ගෙදෙට්ටම ට්‍රාන්ස්පෝට්" ඔහු අසන්නේ කුතුහලයටය.

"අනේ මන්දා චන්ද්‍රසේන අංකල්.. මාත් මේ කල්පනා කළේ ඒක තමයි"

"මිස්ට ප්‍රමෝෂන් එකක් දෙන්න යනවද දන්නෙ නෑ"

"එහෙමද දන්නෙත් නෑ.." ස්නේහා සිනාසුණා ය.

0000000000000000

ස්නේහා පිටව ගිය පසු අකලංකට දැනුණේ මහත් පාලුවකි. ජනේලයෙ තුළින් ඈත පෙනෙන ගොඩනැගිළි දෙස බොහෝ වේලාවක් බලා සිටි ඔහු ඇඳ මත වැතිරුණේ ය. ස්නේහා අතින් මනාව සැකසුණ ඇඳ ඔහුට සුවයක් දුන්නේ ය.

ඔහු නිරායාසයෙන් ම පසුගිය කාලය පුරාම වරින් වර තමා සම්බන්ධ වූ කලකෝලාහල එකින් එක නැවත ආවර්ජනය කරන්නට පටන් ගත්තේ ය. ඒවායින් සමහරක් පුවත්පත් වල ප්‍රවෘත්ති මවන්නට සමත් වූ අතර තවත් සමහර සිදුවීම් යට කර දමන්නට මුදල් වලට හැකි ව තිබුණි. තාත්තා කොයි තරම් නම් වාරයක් තමාට අවවාද කළා ද? ඒ සියල්ල වතුරේ යන්නේ තමාගේ නොදැමුණ සිත නිසා බව ඔහු දනියි. ඉවසීමක් නැති කම තමාගේ වරදක්දැයි සිතන්නට ඔහු බෙහෝ විට වෙහෙසෙමින් සිටියේ ය. තමා කෝප ගන්නේ ස්නේහා කීවා සේ මහන්තත්ත කමකටද? ඇත්තටම මේ පිටවන්නේ අඩිමාන්නයද? සියලු දෙනාම තමන්ට යටහත් පහත් ලෙසස ළකිය යුතු යයි සිතෙන්නේ ඒ නිසා ද?

තාත්තා යන විට ජංගම දුරකතනය රැගෙන ගිය බැවින් කිසිවකුට කතා කරන්නට වත් නොහැකි ය. ඔහුට චාපා මතක් වෙයි. ඈ සුන්දර යුවතියකි. එහෙත් මොකක්දෝ නොපෑහෙන ගතියක් ඈ වෙතින් ඔහු දකියි. ඇයට සිත ළං නොවෙයි. ඇයටද එසේම සිතෙනවා ඇති යයි ඔහුට සිතෙයි.

ජීවිතයේ වෙනසක් විය යුතු ය. මේ ගමන මේ ලෙසින් යාම මහත්ම පීඩාවකි. අකලංක දෑස් පියාගෙන නිදන්නට උත්සාහ කළේ ඒ හැඟීම සිත තුළ දරාරෙැන ය.

0000000

ස්නේහා උදෑසනින්ම රෝහලට යාමට සූදානම් වූවා ය. උදේ හය වන විට චන්ද්‍රසේන පැදවූ වාහනය ඇගේ බෝඩිම ඉදිරියේ නැවතුණි. ස්නේහා වහා දුවගොස් එයට ගොඩවුණා ය.

"මං හිතුව මිස් තව වෙලා ගනියි කියලා.." චන්ද්‍රසේන හැරී පසුපස බලා කීවේ ය. ".. එළියට වෙලා බලං ඉන්න වෙයි කයලා මං කෝකටත් කියවන්න පත්තරයක් ගත්තා.. මෙන්න මිස්.. යන ගමන් කියවන්න" ඔහු පත්තරය පසුපසට දිගු කළේ ය. ස්නේහා එය අතට ගෙන දිගහැර බැලුවා ය. පත්තරයේ මුල් පුවත ළඟ ඇගේ ඇස් නැවතුණි.

"ආරක්ෂක නිලධාරියාට පහර දුන් කෝටිපති පුතා රෝහලේ සැඟවෙයි"

ස්නේහා තුෂ්නිම්භූතව බලා සිටියා ය.

"දෙයියනේ... මේ නිව්ස් එක පත්තරේට දුන්නෙ කවුද?" ඇය සිතුවා ය.

**මතු සම්බන්ධයි**

# ක්‍රිකට් කතන්දර

## අත් ආවරණ හා පා ආවරණ නොමැතිව කඩුලු රැක්ක ඉයන් බොතම්



**ඉයන් බොතම්**

එංගලන්තයෙන් බිහි වූ සුපිරි තුන් ඉරියව් ක්‍රීඩකයෙක් මෙන්ම කලක් එංගලන්ත ක්‍රිකට් කණ්ඩායමේ නායකත්වය දැරූ සර් ඉයම් බොතම් ගැන අපි කවුරුත් හොඳින් දන්නවා. ඉයම් බොතම් 1993 ජූලි 19 වැනිදා ඩරම් ප්‍රාන්ත කණ්ඩායම හා සංචාරක ඕස්ට්‍රේලියානු ක්‍රිකට් කණ්ඩායම අතර පැවැත්වුණු තරගයේදී අවසන් ඕවරයේදී කඩුලු රැක තිබෙන්නේ කිසිම අත් හෝ පා ආවරණයක් පැළඳ නොගනිමින්. මේ ක්‍රියාව දුටු ප්‍රේක්ෂකයන් විමතියට පත් වූ බව සඳහන් වෙනවා.

## වම් අත කැඩුණු පසු දකුණු අතින්



**මැල්කම් මාර්ෂල් තනි අතින් පිත්ත හසුරවමින්**

මේ කතා ටෙස්ට් ක්‍රිකට් පිටියේ අමතක නොවන අවස්ථාවක් ලෙස සඳහන් කරන්න පුළුවන්. සුපිරි බටහිර කොදෙව් වේග පන්දු යවන්නෙකු වූ මැල්කම් මාර්ෂල් පිළිබඳව ඔබ සමහර විට අසා ඇති. ඔහු තමයි මේ සිදුවීමට මූලික වන්නේ.

1984 ජූලි මාසයේදී බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම හා එංගලන්තය අතර එංගලන්තයේ පැවැත්වුණු ටෙස්ට් තරගයේදී පළමු දිනයේ පන්දු රකිමින් සිටියදී වම් අතේ සිදු වූ අස්ථි බිඳී යාමක් හේතුවෙන් දින 10ක් යනතුරු විවේක ගන්නා ලෙස වෛද්‍යවරයා විසින් මාර්ෂල්ට උපදෙස් දෙනවා. තරගයේ තුන්වන දිනයේ අවාසනාවන්ත ලෙස නව වන විකට්ටුව බිඳ වැටෙන්නේ ලැරී ගෝමස් නම් බටහිර ඉන්දීය පිතිකරුවා ලකුණු 96ක් රැස්කරගෙන සිටින අවස්ථාවේ යි. වම් අතට වෙළුම් පටියක් දමාගෙන ලැරී ගෝමස්ගේ ශතකය සම්පූර්ණ කරන්නට සහායවීම සඳහා ක්‍රීඩාගාරයේ සිට දිව එන මාර්ෂල් දැකීමෙන් ප්‍රේක්ෂකයන් අත්පොලසන් දුන්නා.

roar.media